පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 09

# අවසාන වාර පරීක්ෂණය - 2022
# නර්තනය

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

කාලය : පැය 2 ½ යි.

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. '' තෙයිතක තෙයිතක තෙයිතක තෙයි '' මෙය,
   - i. 7 වන පා සරඹයයි.
   - ii. 10 වන පා සරඹයයි.
   - iii. 12 වන පා සරඹයයි.
   - iv. 8 වන පා සරඹයයි.
2. උඩරට නර්තන සම්ප්‍රදායේ 9 වන ගොඩ සරඹය හඳුන්වන සරඹ නාමය වන්නේ,
   - i. අර්ධ චක්‍ර සරඹය
   - ii. දෑත පැගීමේ සරඹය
   - iii. දෑල සරඹය
   - iv. අංගහාර සරඹය
3. ශාන්තිකර්මවල අන්තර්ගත වී ඇති ගායනා වන්නේ,
   - i. ප්‍රශස්ති කවි හා සොකරි කවි
   - ii. ගොයම් කවි හා කඩතුරා කවි
   - iii. කඩතුරා කවි හා පන්නෙළීමේ කවි
   - iv. ගොයම් කවි හා පන් නෙළීමේ කවි
4. ශබ්දපූජා මගින් ශ්‍රී මහා බෝධියට පූජා පැවැත්වීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු බව නියම කළ රජු වන්නේ,
   - i. දේවානම්පියතිස්ස රජු
   - ii. දුටු ගැමුණු රජු
   - iii. අශෝක අධිරාජයා
   - iv. භාතිකාභය රජු
5. සාම්ප්‍රදායික මිනුම් ක්‍රම අනුව ගැටබෙරයේ සම්මත දිග වන්නේ,
   - i. එක් වියත් තුන ගුලකි
   - ii. රියන් දෙකකි
   - iii. සත් බඹ සත් අතකි
   - iv. තුන් වියත් තුන ගුලකි
6. ''නළලෙහි සළකුණු තබා දේවදාසීන් සත්දෙනෙක් පිදූ බව '' සඳහන් වන්නේ,
   - i. කොරවක් ගල ලෙන් ලිපිය.
   - ii. පාලමොට්ටායි සෙල් ලිපිය.
   - iii. සැස්සේරුව සෙල් ලිපිය.
   - iv. නිශ්ශංකමල්ල ගිරි ලිපිය.
7. පත්තිනි, දෙවොල් දෙවියන් පුද ලබන ශාන්තිකර්ම වන්නේ,
   - i. කොහොඹාකංකාරිය, දෙවොල් මඩුව.
   - ii. දොවොල් මඩුව, ගම්මඩුව.
   - iii. කොහොඹාකංකාරිය, පහන් මඩුව.
   - iv. දොවොල් මඩුව, පහන් මඩුව.
8. ගත්ත තෙහිගු තකට තකුඳ .... මෙය
   - i. තුරඟා වන්නමේ අඩව්ව යි.
   - ii. වෛරොඩි වන්නමේ අඩව්ව යි.
   - iii. වෛරොඩි වන්නමේ කස්තිරම යි.
   - iv. තුරඟා වන්නමේ කස්තිරම යි.
9. තහලම් තල බෙර තම්මැට පට තත්තිරි ඩමරු '' මෙම පද්‍ය ඇතුළත් සංදේශ කාව්‍ය වන්නේ,
   - i. පරවි සංදේශය.
   - ii. තිසර සංදේශය.
   - iii. සැලළිහිණි සංදේශය.
   - iv. සැවුල් සංදේශය.

10. සොකරි නාටකය යනු,

i. පහතරට සම්ප්‍රදායට අයත් ගැමි නාටකයකි.

ii. උඩරට සම්ප්‍රදායට අයත් ගැමි නැටුමකි.

iii. සබරගමු සම්ප්‍රදායට අයත් ගැමි නාටකයකි.

iv. උඩරට සම්ප්‍රදායට අයත් ගැමි නාටකයකි.

11. "ජිං ගත ගොගො " මෙම බෙර පදයට අනුව නර්තනය කළ හැකි වන්නම වන්නේ,

i. තුරඟා වන්නම        iii. වෛරොඩි වන්නම

ii. හනුමා වන්නම        iv. සිංහරාජ වන්නම

12. කථක් නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත වී ඇති ගුරුකුල සංඛ්‍යාව

i. තුනකි.        iii. හතරකි.

ii. පහකි.        iv. දෙකකි.

13. කැලණි පාලම, මෝදර මෝල නාට්‍ය කුමන නාට්‍ය ශෛලීන් ගණයට අයත් ද?

i. ශෛලිගත නාට්‍යය.        iii. ගීත නාට්‍යය.

ii. තාත්වික නාට්‍යය.        iv. මුද්‍රා නාට්‍යය.

14. ගීතයක රිද්මය ඉස්මතු කෙරෙන චලන විශේෂය වන්නේ,

i. අභිචලන        iii. ප්‍රකාශාත්මක චලන

ii. රිද්මානුකූල චලන        iv. තාලානුකූල චලන

15. ' අක්කේ අක්කේ අර බලන්නකෝ ' ගීත සංගීතවත් කරන ලද්දේ,

i. ආර්. මුත්තුසාමි        iii. ලූෂන් බුලත්සිංහල

ii. ආනන්ද සමරකෝන්        iv. සංගීත් වික්‍රමසිංහ

❖ **අංක 16 සිට 20 දක්වා පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**

1.


2.


3.


4.


16. මෙහි අංක 2 සහ 4 රූප වලට අයත් වාද්‍ය භාණ්ඩ අයත් වන්නේ,

i. ආතත        iii. විතතාතත

ii. විතත        iv. ආතවිතත

17. කතක් නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ඇතුළත් අංකය වන්නේ,

i. 4 කි.        iii. 1 කි.

ii. 2 කි.        iv. 2 කි.

18. ආගමික උත්සව අවස්ථාවල බහුලව දැකිය හැකි වාද්‍ය භාණ්ඩ වන්නේ,

i. 1, 3, 2        iii. 1, 3, 4

ii. 2, 3, 4        iv. 1, 2, 3

19. කෙපුඩිවලල්ල සුරත්තට්ටුව යන කොටස් අයත් වන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | තම්මැට්ටම | iii. | තබ්ලාව |
| ii. | ගැටබෙරය | iv. | හොරණෑව |

20. කොහොඹාකංකාරිය ශාන්තිකර්මය තුළ වාදනය කරනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ඇතුළත් අංකය වන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | 1 කි. | iii. | 3 කි. |
| ii. | 2 කි. | iv. | 4 කි. |

❖ **අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැන්වලට සුදුසු පිළිතුරු ලියන්න.**

21. පහතරට නර්තන සම්ප්‍රදායේ ශුද්ධමාත්‍රා නැටුම සහ දෙවොල් පද හත ක්‍රමවත්ව සකස් කිරීම ........................................ ප්‍රධානත්වයෙන් සිදුවිය.
22. කථක් නර්තනය උගන්වනු ලබන අධ්‍යාපන ආයතනයක් ලෙස ................................ නම් කළ හැකි ය.
23. වාචික අභිනයෙන් තොරව චලන මූලික කොටගෙන කතාවක් ඉදිරිපත් කිරීම ......................... නාට්‍යවල දී සිදු කෙරේ.
24. සැළලිහිණි සංදේශය අයත් වන්නේ ................................. යුගයට ය.
25. ''වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ '' මෙය ..................................... අයත් ගායනාවකි.

❖ **26 සිට 30 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද වැරිදි නම් ✕ ලකුණ ද යොදන්න.**

26. උඩරට පා සරඹ සබරගමු නැටුමේ ඉලංගම් සරඹ ලෙස හැඳින්වේ. (..........)
27. ''නටන ගහපතියා විසින් පවරා දෙන ලදී '' මෙම ප්‍රකාශය අයත් සෙල්ලිපිය පොළොන්නරු යුගයට අයත් වේ. (..........)
28. ශාන්තිකර්ම ගායනාවල පන් කවි ඇතුළත් වේ. (..........)
29. හක් ගෙඩිය, හොරණෑව, '' සුෂිර '' භාණ්ඩ වලට අයත් වේ. (..........)
30. '' ජිත් සහ නං '' අක්ෂර සතර බීජාක්ෂර වලට අයත් වේ. (..........)

## II කොටස

❖ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

❖ **සෙසු ප්‍රශ්න වලින් <u>ප්‍රශ්න හතරක්</u> තෝරාගෙන <u>ප්‍රශ්න පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.**

01.
i. උපදේශාත්මක වන්නමක් ලෙස ...................... වන්නම හඳුන්වයි.
ii. ''කතට කුදට'' මෙය උඩරට ...................... අයත් සරඹයකි.
iii. සිංහරාජ වන්නමට අයත් තාල රූපය ...................... වේ.
iv. කථක් නර්තනය පිළිබඳ ග්‍රන්ථයක් රචනා කරන ලද්දේ ...................... විසිනි.
v. කරදිය මුද්‍රා නාට්‍ය ...................... මහතා විසින් නිර්මාණය කරන ලදී.
vi. නිරෝගී ශරීරයක් පවත්වාගෙන යාමට කායික සුවය මෙන්ම ...................... වැදගත් වේ.
vii. උදාව, රන්දද, වේදනා මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන් ලද්දේ ...................... විසිනි.
viii. '' සිද්ධ මුනිඳු වැඩහිඳ බෝ මුල විදුරාසන '' මෙය ...................... ගායනාවකි.
ix. කුඳගත ගත ගත කුකුඳත් ගජිංත ගත් ජිත් කුංදත් ...................... මෙය කස්තිරම වේ.
x. 10 වන ගොඩ සරඹය ...................... අඩිය ලෙස හඳුන්වයි.

02. i. මාත්‍රා 3 තාල රූපයට අයත් කඩතුරා කවියක් ලෙස ලියන්න. *ලකුණු -5*

ii. මාත්‍රා 4 තනි තිතට අයත් බෙර පදයක් හා කවියක් ප්‍රස්තාර කරන්න. *ලකුණු -5*

iii. මාත්‍රා 3 ට අයත් අඩව්වක් ප්‍රස්ථාර කරන්න. *ලකුණු -5*

03. i. සොකරි කවි පිළිබඳ හැඳින්වීමක් කරන්න. *ලකුණු -5*

ii. පංචතූර්ය වාදනය පිළිබඳ හඳුන්වන්න. *ලකුණු -5*

iii. සිංහල සහ ද්‍රවිඩ ගැමි නැටුම් පිළිබඳ හඳුන්වන්න. *ලකුණු -5*

04. i. දොවොල් මඩුව පැවැත්වීමේ අරමුණු **හතරක්** ලියන්න. *ලකුණු -4*

ii. කොහොඹාකංකාරිය සඳහා භාවිතා කරන වාද්‍ය භාණ්ඩය නම් කර ඒ පිළිබඳ හඳුන්වන්න. *ලකුණු -6*

iii. පහන් මඩුව ශාන්තිකර්මයේ උපත් කතාව මඟින් ගත හැකි ආදර්ශයන් මොනවා ද? *ලකුණු -5*

05. i. නර්තන කලාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයාගත හැකි සෙල්ලිපි **තුනක්** නම් කරන්න. *ලකුණු -5*

ii. පොළොන්නරු යුගයේ හිංදු අභාසය ලැබුණු බව සඳහන් සෙල්ලිපිය නම්කොට එහි සාධකය ඉදිරිපත් කරන්න. *ලකුණු -5*

iii. කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍යක් නම් කොට එහි නර්තනය පැවති ආකාරය සඳහන් කවියක් ලියන්න. *ලකුණු -5*

06. පහත සඳහන් මාතෘකා **තුනක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. විල්සන් ඔලබො ඩුව ගුරුතුමා

ii. පංචතූර්ය වාදනය

iii. දේශීය නාට්‍ය වර්ග

iv. කඩතුරා කවි

v. ගොඩසරඹ *ලකුණු -5x3*

07. i. කථක් නර්තනය ප්‍රචලිත ගුරුකුල **හතරක්** නම් කරන්න. *ලකුණු -4*

ii. කථක් නර්තනයේ සංගීත සම්ප්‍රදාය සහ නර්තන අංග නම් කරන්න. *ලකුණු -5*

iii. කථක් නර්තනය ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් **දෙකක්** නම්කර එක් අයෙකු පිළිබඳ හඳුන්වන්න. *ලකුණු -5*


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න